# පිස්සකුගේ හදවත

ඒ පිස්සෙක් වෙනස් කෙනෙක්ව දුටු විට බොහෝ දෙනා කියන්නෙ එහෙමයි. වෙනස් විදියට ලෝකය දැකීමේ පව හින්දම සමහරුන්ට ලෝකෙන් ගැහැට විඳින්න සිදු වුනා. ඒත් තමන් ස්වාභාවිකයි සාමාන්‍යයයි කියන අය නොදන්න දෙයක් තියෙනව. ඒ තමයි මිනිහ දඩයම නවත්තල එඬේර වුනෙත්, එඬේර ගොවිය වුනෙත්, පිස්සෙක් කියල බැනුම් අහ අහම වෙනස් විදියට හිතපු අය නිසා බව. බොහෝ දෙනා කියන්නෙ අපිට ඒ දන්ඩෙ යන්න බෑ කියල. එහෙම කියන අය නොදන්න දේ තමයි ඒ යන්න අමාරු ඒ දන්ඩ වෙනුවට පාලම හැදුවෙ ඔය වෙනස් අයම බව. මෙහෙම වෙනස් විදියට හිතීමෙ ආදීනව මෙනෙහි කර කර ඉද්දි තමයි එයාල ආවෙ. එයාල තමයි හර්මන් හෙසගෙ ඩේමියන් පොතේ ඉන්න ඩේමියනුයි සිංක්ලෙයාරුයි.

**කුරුල්ලා බිජුවටින් එළිබැසීමට සටන් කරයි. බිජුව නම් ලෝකය වන්නේ ය. අලුතින් ඉපදීමට අවශ්‍ය තැනැත්තේ පළමුව ලෝකයක් විනාශ කළ යුත්තේ ය.**

සිංක්ලෙයා එහෙම කියපු වෙලාවෙ ඉඳන් මම මේ පිලිගන්නයි සම්මතයි කියල කියන දේවල් බිඳල දාල නිදහස් වෙන්න බැලුව. ඒත් එකපැත්තකින් පන්සලේ හාමුදුරුවොයි, අනිත් පැත්තෙන් ඉස්කෝලෙ සර්ලයි, අනිත් පැත්තෙන් ගමේ මිනිස්සුයි ඉද්දි මම කොහොමද සහෝදරය නිදහසේ හිතන්නෙ? ආගම, අධ්‍යාපනය, සංස්කෘතිය කියන දම්වැල් තුනකම්ම ගැටගහල ඉන්නෙ මම විතරක් නෙමේ කියල දැනගත්තෙ හෙසගෙන්.

**කිසියම් මෝඩ සිරිතක් වැරදි බව පෙන්වා දුනහොත් කිසිවකු ඔහුට ගරු නොකරනු ඇත. ආදර්ශයට නොගනු ඇත. ඒ වෙනුවට ගුරුවරයාගේ අසීමිත අධිකාරී බලය මගින් දඬුවම් කෙරෙනු ඇත.**
**පාසලේ දී කියා දුන් කිසියම් වීර චරිතයක් මෙන් ක්‍රියා කිරීමට ගියහොත් ඔහු අමුතු හෝ පිස්සු කෙනෙකු සේ හංවඩු ගසා අපහාසට ම ලක් කෙරෙනු ඇත.**

මටත් ඔය දේ වුනා. මුලු ලෝකෙම තරාදියෙ තියල මනින නැත්නම් සංඛ්‍යාත්මකව හරි රසායනිකව දකින විශයක වටිනාකම වැඩිම වෙන්දේසි මිලට හරි වෘත්තීමය වටිනාකමට හරි සාපේක්ශව මනින සමාජයක තාමත් ජුදාස්ලට බෘටස්ලට දේවදත්තලට අංගුලිමාලලට වෛර කරන තස්ලිමාගෙ රුෂ්ඩිගෙ හිස ඉල්ලල කෑ ගහන සමාජයක දාර්ශනිකව කලාත්මකව නව්‍ය විදියට තර්කානුකූලව ලෝකෙ දිහා බලන අයට හිමි වෙන්නෙ පිස්සන්ගෙ තැන උනත් අනාගත ඉතිහාසය ඒ වැරැද්ද නිවැරදි කරන බව හීනෙන් මතුවෙච්ච අන්ධ ගැලීලියෝල පන පිටින් පිච්චිච්ච බෲනෝල කියල දුන්න. ඒ ඔක්කොම දරා ගන්න පිස්සන්ගෙ හදවතට හයිය තියෙනව කියල සල්මන් රුශ්ඩිල තස්ලිමා නස්රීන්ල සොක්‍රටීස්ල කියල දුන්න.
අපේ බුද්ධියෙන් ඔබට වැඩක් නැති වේවි, අපි විකිනෙන්නෙ නැති නිසා. ඒ වගේම අපේ හදවතිනුත් ඔබට වැඩක් නැති වේවි, අපි ඔබේ ලෝකයට අමුත්තන් නිසා. නමුත් අපි විශ්වාස කරනවා හුදකලාව තුල ලැගුම් ගත් නිහඬ බව අරක් ගත් නාසිසස් කෙනෙක් ලඟට වීනස් ලංවෙලා දෙවියන් වෙනුවෙන් මම ඔබට සාධාරනය ඉටු කරම් කියල දිවුරාවි කියාත්, ඔවුන්ගේ කඳුලු වලින් පිස්සන්ගේ හදවතේ සිරවුන ලේ කැටිත් උගුරේ සිරවුන බරැති ගුලිත් දිය වෙලා යාවි කියාත්.

**අප ලෝකය හමුවේ අමුතු හෝ උමතු ලෙස පෙනෙනු ඇත.අපි පිබිදුණෝ වන්නෙමු.නැත්නම් පිබිදෙමින් සිටිනවුන් වන්නෙමු .අන් අයගේ තැත තම අදහස් සිය රැලේ වුන්ට සම කිරීමයි. නමුත් අප උත්සාහ කරනුයේ සොබාදහමේ කැමැත්ත කිසියම් නව මානයකට නවස්ථරයකට හා අනාගතයකට යොමු කිරීමටයි .සෙස්සෝ පවතින තත්ත්වයේ ම දිවි ගෙවීමට වෙර දරති.**

සචින්ත මදුශාන්

---

පන්නරය, තක්සලාව, ලංකාදීප (ඉරිදා) , 2012 ජුලි 15
(තදකලු අකුරින් ඇති තැන් උපුටා ගත්තේ හර්මන් හෙසගේ ඩේමියන් පොතට මහින්ද පතිරන එනමින්ම කල සිංහල පරිවර්තනයෙනි.)